# රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට නෙදර්ලන්ත රජයෙන් සහාය

**රෝෂන් තුෂාර**

වසර 105 ක් පැරණි රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ලෝකයේ දියුණු රස පරීක්ෂක අංශය හිමි නෙදර්ලන්ත රජයේ සහාය ඇතිව වැඩිදියුණු කිරීමට රජය කටයුතු සම්පාදනය කර ඇත.

මේ ප්‍රතිසංවිධාන කටයුතු ආරම්භ කිරීමට නෙදර්ලන්ත නියෝජිත පිරිසක් ලබන දෙසැම්බර් මස ලංකාවට පැමිණීමට නියමිතය.

අධිකරණ ඇමති මිලින්ද මොරගොඩ මහතා නෙදර්ලන්ත රජය සමඟ කළ සාකච්ඡාවලින් අනතුරුව මේ සහාය ලබාදීමට එකඟ වී ඇත.

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ ඇමති මිලින්ද මොරගොඩ මහතා නෙදර්ලන්ත අධිකරණ ඇමති අර්නස්ට් එම්. බෙලලින් මහතා ප්‍රධාන එරට රජයේ නියෝජිතයින් හමුවූ අවස්ථාවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ සාකච්ඡා කැර ඇත.

රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ආයතනික ශක්තිය නැංවීම හා මානව සම්පත් සංවර්ධනය සඳහා සහාය පළ කිරීමට එහිදී එකඟ වී ඇත.

1904 දී ස්ථාපිත කරන ලද රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මහජන ආහාර පාන සම්බන්ධයෙන් හා අපරාධ සම්බන්ධයෙන් විද්‍යාත්මක තොරතුරු විශ්ලේෂණය කිරීමෙහි නිරතව සිටී.

ත්‍රස්තවාදය නිමාවූ ශ්‍රී ලංකාවේ සාමය හා නීතිය ස්ථාපිත කිරීමේ වැදගත් කාර්ය භාරයක් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් ඉටුවන බව අධිකරණ ඇමති මිලින්ද මොරගොඩ මහතා නෙදර්ලන්ත රජයට කරුණු දක්වා තිබේ.